# ක්‍රිස්තියානීන්ට බෞද්ධයා බිලිදීම



මාක්ස්, ලෙනින්වාදී අන්තයෙන්ද, ලිබරල්වාදී අන්තයෙන්ද මිදී, දම්පල් තුමන් ගත් හෙළ බොදු මගට පිවිසි ලොකුසතු හේවා මෙත්තානන්ද හෙවත් එල්.එච්. මෙත්තානන්ද මහාසයාණෝ 1956 පෙබරවාරි 4දා අනඳ විදුහලේදී එළිදැක්වූ බෞද්ධ කමිටු වාර්තාව සඳහා අප්‍රමාණ මෙහෙවරක් කළහ. එසේම, එහි අධ්‍යාපනය සම්බන්ධ කොටසෙහි රචකයාණෝද වෙති. සිංහල බෞද්ධ අධ්‍යාපනය වෙනුවෙන් මහත් මෙහෙවරක් කළ එතුමාණෝ ක්‍රිස්තියානි මූලධර්මවාදයට හා දෙමළ බෙදුම්වාදයට එරෙහිව පැහැදිලි හඬක් හා වැඩපිළිවෙලක් ගොඩනැගූ ජාතික වීරයෙකි.!

## බෞද්ධ කොමිසමේ වාර්තාව පිළිගැන්වීමේ උත්සවයේදී කළ කථාව (මේ උත්සවය කොළඹ ආනන්ද විදුහලේදී පවත්වන ලදි.)

අද දින 1956-02-04 අප ඉතිහාසයේ නව පරිච්ඡේදයක් උදාවෙයි. අද දින අප ගන්ට යන තීරණය පිට බුද්ධ ශාසනයේ අනාගතය රඳා පවතියි. අද නිකුත් කළ වාර්තාව තමුන්නාන්සේලා හොඳින් කියවා බැලීමෙන් විදේශීය ආණ්ඩු තුනක් බුද්ධ ශාසනය විනාශ කිරීමට ගත් බලවත් උත්සාහය තේරුම් ගන්නට පුළුවන. වර්තමාන ආණ්ඩුව මහජනයා විසින් තෝරාගත් අපේම මන්ත්‍රීන්ගෙන් සමන්විත නිසා බුද්ධ ශාසනය පෙරට වඩා හොඳට පවතීද? ඉංග්‍රීසීන්ට අප යටත්ව සිටියදී එංගලන්ත සභාව රාජ්‍ය ආගම විය. නිදහස් ලංකාවේ වැඩි බලය ඇත්තේ රෝමානු කතෝලික සභාවටද නැත්නම් බුද්ධ ශාසනයටද? අපේ ආණ්ඩුව බුද්ධාගමට බොහෝ දේ කරනවා යැයි හැමතැනම මහත් සේ ඝෝෂා කරයි. දළදා මාළිගාවට අළුත් ගොඩනැගිල්ලක් සාදනවා, මහියංගණ දාගැබ් වහන්සේ ප්‍රතිසංස්කරණය කරනවා, පත්තිරිප්පුව, මඟුල් මඩුව බුද්ධාගමට ආපසු දෙනවා යයි මුරගා කියයි. මේවා හොඳ වැඩ තමා, නමුත් අලුත් ගොඩනැගිලි තැනීමෙන් හෝ පුරාණ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණයෙන් හෝ පමණක් බෞද්ධ ජීවිතය නැවතත් මෙරට ඇති කරගන්ට පුළුවන්ද? පාලි ත්‍රිපිටකය සිංහලට පෙරලීමද බෞද්ධ විශ්ව කෝෂයක් සැපයීමද හොඳ වැඩ තමා. නමුත් ඒවායින් පමණක් බෞද්ධ ජීවිතය නැවතත් මෙරට ඇති කරගන්ට පුළුවන්ද? බෞද්ධයින්ට අපේ ආණ්ඩුව ගොඩනැගිලිද, පොත්ද දෙයි.

නමුත් අපේ ආණ්ඩුව රෝමානු කතෝලිකයින්ට දෙන්නේ මොනවාද? අපේ ආණ්ඩුව ඔවුන්ට බෞද්ධ දරුවන් බිලිදෙයි. අපේ ආණ්ඩුව බෞද්ධ දරුවන්ගේ අධ්‍යාපනය උදෙසා ක්‍රිස්තියානි රුපියල් හාරසිය ලක්‍ෂයක් අවුරුදු පතා දෙයි. අපේ ආණ්ඩුව අපේ ලෙඩ්ඩු රෝමානු කතෝලික පූජක සාත්තුකාරයන්ට පාවාදෙයි. කොළඹ මහා රෝහල ඔවුන් බාරේය. නොබෝදා මහනුවර බෝගම්බර කන්දේ විදේශික පූජක සාත්තුකාරයන් පහළොස් දෙනෙකුට නැවතීමට රුපියල් 750,000 ක් වියදම් කොට උඩුමාලේ පල්ලියක් ඇති විශාල මාළිගාවක් ආණ්ඩුව තනාදී තිබේ. ඒ පල්ලිය මත පිහිටුවා තිබෙන කුරුසය දළදා මාළිගාවේ කොත් කැරැල්ලට ඉහළින් පෙනේ. විදේශීය පූජක සාත්තුකාරයන් ටික දෙනෙකුට මෙවැනි මාළිගා තනද්දී දහස් ගණන් අසරණ ලෙඩ්ඩු රෝහලේ බිම වැතිරී සිටිති. මහනුවර රෝහල එකී පූජක සාත්තුකාරියන්ට ආණ්ඩුව බාරදෙන්නට යයි. තව අවුරුදු ස්වල්පයකදී වෙනත් විශාල රෝහල්ද රෝමානු කතෝලික පූජක සාත්තුකාරියන්ට ආණ්ඩුව බාර දෙනවා ඇත. බෞද්ධ අනාථ දරුවන්, බෞද්ධ මහල්ලන්, බෞද්ධ අඳ ගොළු බිහිරි ළමයින් නඩත්තු කිරීම පිණිස ක්‍රිස්තියානි ආයතනවල බෞද්ධයන්ට සිදුවන විපත අපි දනිමු.

ලංකා ආණ්ඩුවේ ආදායමට දෙවෙනි වන ආදායමක් රෝමානු කතෝලික සභාවට ඇත්තේය. ඒ සභාව කිසිම බද්දක් ආණ්ඩුවට නොගෙවයි. ඒ ධනවත් සභාව තව තවත් ධනවත් කිරීම පිණිස අග්‍ර බිෂොප්තුමාගේ ඉල්ලීම පරිදි ආණ්ඩුව විසින් අලුතෙන් පටන් ගන්නා ලද ජනපද රාශියක රෝමානු කතෝලිකයන් පදිංචි කරවා ඇත. ලංකාවේ හැම පෙදෙසකම එකම කතෝලිකයෙක් නැති පෙදෙසක පවා පල්ලි සෑදීමට ආණ්ඩුවෙන් ඉඩම් දී තිබේ. ආණ්ඩුවේ මේ ක්‍රියාවට බෞද්ධයෝ තදින් විරුද්ධ වෙත්. බෞද්ධ ජනයාගේ දිළිඳුකම, නූගත්කම, අසරණකම තමන්ගේ වාසියට හරවා



ගැනීම රෝමානු කතෝලික සභාවේ අයුතු ක්‍රියාවකි. "ලේක් හවුස්" පුවත්පත් ආණ්ඩුවටද රෝමානු කතෝලික සභාවටද පක්‍ෂව ක්‍රියා කරති. බෞද්ධයන්ගේ දුක්ගැනවිලි ගැන නොසලකති. එපමණක් නොව රෝමානු කතෝලික සභාවේ පූජකයන්ද, කන්‍යාවරුන්ද, පෙරෙට්ටුවද, පෙළපාලිද හුවා දක්වන පින්තූර හා වාර්තා ලේක් හවුස් පත්‍ර නිතරම පළ කරති. බෞද්ධයන්ගේ දුක්ගැනවිලි යටපත් කරමින් බෞද්ධයන්ට ඉවසපල්ලා, ඉවසපල්ලා, කියා අවවාද කරති. එක් අතකින්, දිණමින, සිළුමිණ, ජනතා යන සිංහල පත්‍ර සංඝයා වහන්සේලාට හා සිංහල කථා කරන උදවිය රවටති. අනිත් අතින් ඩේලි නිවුස්, ඔබ්සර්වර් යන ඉංග්‍රීසි පත්‍ර සංඝයා වහන්සේලාට හා සිංහල කථා කරන උදවියට සරදම් කරති. ආණ්ඩුව ප්‍රීති වෙයි. රෝමානු කතෝලික සභාව උදම් අනයි. ඉහත කී ආධාර ආණ්ඩුව කතෝලිකයන්ට දෙයි. අපේ නායක් ස්වාමීන් වහන්සේලාට ආණ්ඩුව අක්ත පත්‍ර ප්‍රදානය කරයි. උන්වහන්සේලාගේ ආදාහන උත්සවවලටද සහභාගි වෙයි. මහජනයා රැස්වෙන අවස්ථාවන්හිදී පෙරහැරවල්ද වෙනත් උත්සව ආණ්ඩුව ජයට පවත්වයි. ආණ්ඩුව එසේ කරන්නේ බුද්ධාගමට හුඟක් වැඩ කරනවා යයි මහජනයා රැවටීමටය. නමුත් මෙයින් ප්‍රශ්නයක් මතුවෙයි. බෞද්ධ දරුවන් රෝමානු කතෝලික සභාවට බිලිඳුන්නහම එසේම දිළිඳු අසරණ ඉඩම් නැති බෞද්ධයින් රෝමානු කතෝලික බිෂොප්තුමා අල්ලාගත්තාම තව ටික කාලකින් ආණ්ඩුව හදන්නට යන බෞද්ධ ගොඩනැගිලි වලට යන්නට බෞද්ධයින් ඉතුරුවේද? ආණ්ඩුව ලියන්ට යන බෞද්ධ පොත් පත් කියවන්නටද බෞද්ධයින් ඉතිරිවේද? බුද්ධ ජයන්ති උත්සවය පිළියෙල කිරීමේදී පවා රෝමානු කතෝලික බලපෑමෙන් ආණ්ඩුවට ගැලවෙන්නට බැරිවී තිබෙන හැඩයි.

රෝමානු කතෝලික ඩී.ආර්.ඕ මහතා මහා පෙරහැරින් බණ පොතක් රැගෙන හාමුදුරු කෙනෙක් ළඟට ගොස් "හාමුදුරුවනේ, මේ බණ පොත සිංහළට පෙරළන්න" යයි ආරාධනා කරයි. සිංහලට පෙරළීම අවසාන වන විට රෝමානු කතෝලික දිසාපති කෙනෙකු සිංහල බණපොත් පෙරලූ හාමුදුරුවන්ට තෑගි බෙදාදීමේ උත්සවයක් යස රඟට පවත්වයි. සැලකිය යුතු කරුණක් නම් දළදා වහන්සේ වැඩ ඉන්න මහනුවර හිටපු දිසාපතිතුමාද, දැන් ඉන්න දිසාපතිතුමාද රෝමානු කතෝලිකයෝ වෙති. තවම මහනුවරට බෞද්ධ දිසාපති කෙනෙක් පත්කිරීමට ආණ්ඩුවට උවමනා වී නැත. ඕනැත් නැත. දැන් කොළඹ පවත්වාගෙන යන ගොවිකම් රජ දැක්මේ අංගයක් වූ බෞද්ධ සංදර්ශනයද බාරදී තිබෙන්නේ රෝමානු කතෝලික කන්‍යාවකටයි. මේ කාරණාවලින් ඔප්පුවෙන්නේ බුද්ධාගම විහිලුවක් හැටියට ආණ්ඩුව හිතාගෙන ඉන්න බවයි. හැම රෝමානු කතෝලික නිලධාරියෙක්ම "කැතලික් ඇක්ෂන්" නැමති කතෝලික ව්‍යාපාරයට බැඳී සිටිති. ඒ ව්‍යාපාරයේ පරමාර්ථය නම් කතෝලික ආගමට අන්‍ය භක්තිකයන් හරවා ගැනීම හා බෞද්ධාගම විනාශ කිරීමට යටින් දෝනා කැපීමයි. ආණ්ඩුව එවැනි අයට බෞද්ධ කටයුතු බාරදී තිබීම බුද්ධ ශාසනයට කරන හෙනහුරුකමකි.

බෞද්ධයින්ගේ සිත් රිද්දන්නට ආණ්ඩුව මැලි නොවේ. ආණ්ඩු පක්‍ෂය පිටිපසින් ලේක් හවුස් පත්‍ර සිටින නිසාය. ලේක් හවුස් පත්‍ර බෞද්ධාගමේ පරම හතුරෙක් බව අපි දනිමු. ආණ්ඩු පක්‍ෂයද ලේක්හවුස් පත්‍රද ඇමරිකන් ජීවිතය හුවා දක්වති. ලේක් හවුස් පත්‍ර කාමභෝගීන්ද, බේබද්දන්ද, පල් හොරුන්ද ශ්‍රේෂ්ඨ අය මෙන් හඳුන්වා දෙති. නමුත් ජාති හිතෛශීන්, අමද්‍යප වීරවරයන්, බෞද්ධ පින්වතුන් පහත් අය මෙන් පෙන්වා දෙති. කොටින් කියතොත් ලේක්හවුස් පත්‍ර බෞද්ධ විරෝධී හා ජාති විරෝධී බලකොටුයි.

බුද්ධ ජයන්ති සංවිධානය තුළ කතෝලික බලපෑම නිසා සිදුවූ කරුණු දෙකක් සඳහන් කරමි. අනුරාධපුර ශුද්ධ නගරයේ රුවන් වැලිසෑයට අයිති පුරාණ ගඩොල්වලින් සාදන ලද රෝමානු කතෝලික පල්ලිය හා මඩම ද ශුද්ධ නගරයෙන් ඉවත්වයන්නට තවම ආණ්ඩුව දැනුම් දී නැත.

රෝමානු කතෝලික බලවතුන්ගේ ඉල්ලීම පිට ස්වදේශභාර ඇමතිතුමා කතෝලික සභාවට දොස් නඟන හාමුදුරුවන්ට විරුද්ධව නඩු පැවරීමට අලුත් නීති රීති ඇතිකිරීමට සූදානම්ව සිටී. මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේ දැනගැනීම පිණිස කතෝලිකයින් බෞද්ධාගමට දෙන සංග්‍රහය ගැන කතෝලික පොත්පත් වලින් උපුටා ගත් නිදසුන්-දෙකක් මම දැන් කියවන්නෙමි. එකක් " හීන් සැරය" කියන කතෝලික පත්‍රයෙන්ද අනෙක "නාගසේන" නම් කතෝලික කෙනෙකු ලියා තිබෙන පොතකින්ද වෙති. මම ඔහුට දෙන නම නම් ජනවාරි 27 වැනි දින මහනුවර මඟුල් මඩුවේදී අග්‍රාණ්ඩුකාරතුමා විසින් අලුත් අනුනායක ස්වාමීන්වහන්සේට දුන් -"පණ්ඩිවරයා"- යන නාමය දෙවන නිදසුන නාගසේන නම් කතෝලික පඬිවරයාගේ පොතකිනි.

මට කල්පනා වෙන හැටියට අග්‍රාණ්ඩුකාරතුමා අනුනායක ස්වාමීන් වහන්සේ "පණ්ඩිවරයෙක්" යැයි හඳුන්වා දුන්නේ ඔහු කළ සිංහල කථාව ඉංග්‍රීසි අකුරෙන් ලියවාගෙන විත් කියවන්නට යෙදුණු නිසා වෙන්ට පුළුවන. "පඬි" කියන සිංහල වචනය ඉංග්‍රීසියෙන් ලියන්නේ " Pandi" කියාලාය. ඒ වචනය සිංහල නොදත් කෙනෙක් කියවන්නේ "පණ්ඩි" කියාලාය.

### "සැරය" නම් කතෝලික පත්‍රයෙන් නිදසුනක්

"මේ මිහිඳු පිරිවර ඔවුන් ඔතාගෙන ආ කහ රෙද්ද පැත්තකින් තබා ලංකාවේ රූමත් ගැහැණුන් දැක උන් කෙරෙහි සිත් උපදවා උන් හා රතිසැප වින්දහ." "සංඝමිත්තා නම් ඔහු නැගණියද තම සොහොයුරාට දිරි දීමක් වශයෙන් හා සිංහල පිරිමින්ගේ ද ලේ දූෂ්‍ය කිරීමටත් තවත් ගැහැණුන් පන්දහසකටත් අධික පිරිවරක් සහිතව ලංකාවට ආවාය. මෙහෙණ සස්නක් අටවාගෙන ඒ ආ ස්ත්‍රීහු ලාංකික පිරිමින්ට දාව දූවරුන් පුතුන් ප්‍රසූත කළහ."

### "නාගසේන" නම් කතෝලික "පඬිවරයාගේ" පොතෙන් 20 පිටුව නිදසුන

"බුදුන්වහන්සේගේ විහාරයෙහි එක්තරා මෙහෙණක් කුස දරු ගැබක් පිහිටියේය.. දරුවා එහිදීම ලැබිණි. මෑත කාලයෙහි මහා කාශ්‍යප නමින් ප්‍රකටව සිටි මහරහතන් වහන්සේ මේ

10 පිටුවට